# සේසත් කර්මාන්තය පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක් (උණවේරුව සාම්ප්‍රදායික සේසත්ගම ආශ්‍රිතව)

එන්.එම්.එස්.ඩී.කේ. නාරායන[1]

ප්‍රමුඛ පදඃ සේසත් කර්මාන්තය, සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම, හස්ත කර්මාන්තය, අස්පර්ශිත උරුමය

## හැඳින්වීම

බටහිර සංස්කෘතික සංස්පර්ශය ට පෙර වූ සිංහල සංස්කෘතියේ ගති සොබාවන්ගෙන් මෙන්ම සාම්ප්‍රදායික ශිල්ප කලාවන්ගෙන් ආඪ්‍ය වූ උඩරට පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ උණවේරුව ග්‍රාමය ආශ්‍රිත හස්ත කර්මාන්තයේ සොඳුරුතම ලකුණ සාම්ප්‍රදායික සේසත් කර්මාන්තයයි. උණවේරුව ග්‍රාමය අදායතනයේ දී, 'සේසත්ගම' ලෙස ද හඳුන්වනු ලබයි. සේසත් ආශ්‍රිත නිෂ්පාදන සඳහා යොදා ගනු ලබන ශිල්ප ක්‍රම මෙරට සාම්ප්‍රදායික කලාවේ සුපෝෂිතතාව මෙන්ම පරිසර හිතකාමී බව ප්‍රකට කරයි. වර්තමාන සමාජ - ආර්ථික රටාව සමඟ විපර්යාසයන්ට ලක් වෙමින් අභාවයට යන සේසත් කර්මාන්තය ආශ්‍රිත සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම හා දැනුම මෙන්ම වර්තමාන අභියෝගතා පිළිබඳව විමසුමක් කිරීම මෙම අධ්‍යයනයේ මුඛ්‍ය පරමාර්ථයයි. ස්පර්ශිත කලා උරුමයක් වන සාම්ප්‍රදායික සේසත් කර්මාන්තය වර්තමාන අභියෝගතා හමුවේ, අනාගතය උදෙසා සුරක්ෂිත කළ හැක්කේ කෙසේද? යන්න පර්යේෂණ ගැටලුව කරගනිමින්, සේසත් කර්මාන්තයේ වර්තමාන ස්වරූපය හඳුනාගැනීම සහ අනාගත පැවැත්ම කෙරෙහි එල්ල වී ඇති අභියෝගතා මානව විද්‍යාත්මක දෘෂ්ටියකින් විමර්ශණය කිරීම හා ඒ සඳහා අලෙවිකරණ ප්‍රවර්ධන සැලසුම් සැකසීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණයි.

## ක්‍රමවේදය

පර්යේෂණ අරමුණු සපුරා ගැනීම සඳහා දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය ලෙස මිශ්‍ර ක්‍රමවේදය තෝරා ගන්නා ලදී. මූලිකවම සාහිත්‍යය මූලාශ්‍ර ඔස්සේ ප්‍රථමික දත්ත සම්පාදනය විය. මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් උණවේරුව ග්‍රාමය අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරාගනිමින් ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේද යටතේ ක්ෂේත්‍ර නිරීක්ෂණ, සහභාගීත්ව නිරීක්ෂණ, ප්‍රශ්නාවලි,

[1] පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ssh2020298@ssh.rjt.ac.lk

සම්මුඛ සාකච්ඡා ඔස්සේ දත්ත රැස් කරන ලදී. ගුණාත්මක දත්ත හා ප්‍රමාණාත්මක දත්ත සන්සන්දනාත්මක විශ්ලේෂණයෙන් නිගමනයන්ට පැමිණ ඇත.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

සේසත් කර්මාන්තයේ ඓතිහාසික පසුබිම විමසීමේදී සංඝමිත්තා මෙහෙණිය සමග පැමිණි දහඅට කුලයට අයත් ශිල්පශ්‍රේණි අතර බ්‍රාහ්මණ කුලයට අයත් සේසත් වියන්නෙකු ද සිටි බව සඳහන් වේ. ඔහු උණවේරුව අසල දිවිල්ල ගමේ වාසය කරමින් ජය ශ්‍රී මහා බෝධිය ආරක්ෂා කිරීම සඳහා මාල හතක් සහිත අව් අතු හෙවත් සේසත් පූජා කිරීමට බැඳී සිටිය අතර ඔහු 'දිනමුතු වල්ලියා' ලෙස ප්‍රකට විය. ආරම්භයේ දී ගමේ පදිංචිව සිට ඇත්තේ පවුල් හතරක් පමණි. 'කිරා දුරයලෑ ගෙදර', 'පුසුඹ දුරයලෑ ගෙදර', 'කොමල දුරයලෑ ගෙදර', 'පංචාවත්තේ ගෙදර' නමින් හඳුන්වන අතර අධ්‍යයතනයේ ද එම වාසගම් ශේෂව පවතී. 'ගෙදර' සහිත වාසගම් පැවතීම සියලු පාරම්පරික සේසත් ශිල්පීන්ගේ පුද්ගල නාමයන්හි පොදු ලක්ෂණයක් ලෙස හඳුනාගත හැක. 1998 වසරේදී "ලොකු කිරියා" නම් පුද්ගලයෙකු විසින් රජයේ සහායෙන් උණවේරුවෙහි සේසත් කලා පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම වැදගත් සංධිස්ථානයකි (නාගොඩ විතාන 2010; 233).

'ඌර්ණගම් වෙහෙර' හෙවත් 'උණගම්වෙහෙර' ලෙස හඳුන්වනු ලබන උණවේරුව ග්‍රාමයේ මෙම සේසත් ගම්මානයේ පවුල් 70 ට ආසන්න සංඛ්‍යාවක් සේසත් කර්මාන්තයේ නියැලෙන අතර ඉන් පවුල් 46 ක්ම ස්ත්‍රී පක්ෂයේ දායකත්වය යටතේ සිදු කිරීම විශේෂී කරුණකි. ඒ අනුව 60% පමණ සේවා නියුක්තියක් වාර්තා වන්නේ සේසත් කර්මාන්තය ආශ්‍රිතවය. අතීතයේදී සේසත වනාහි වැඩවසම් යුගයේ සංකේතයකි. සේසත යනු ස්වේත ඡත්‍රයයි. මුල් කාලීනව සේසත සුදු වර්ණයෙන් නිමැවුණු බැවින් එම නම යෙදුන අතර පසුකාලීනව ස්වාභාවික වර්ණක භාවිතයෙන් ද වර්තමානය වන විට කෘතිම සායම් භාවිතයෙන් ද සේසත් නිර්මාණය වේ. සේසත 'අව් අත්ත' ලෙස ද හඳුන්වන අතර එම නාමය සේසත් ශිල්පීන් පමණක් ව්‍යවහාර කරති. සේසත් නිර්මාණය සඳහා ප්‍රධාන වශයෙන් අමුද්‍රව්‍ය ලබා ගන්නේ තල ගසෙනි. කපාගත් පැසුණු තල අතු දින හතක් පමණ තද අව්වේ වේලා අවානක හැඩයට කපාගන්නා අතර ඒවා "තල අත්ත" ලෙස ද "තට්ටු" ලෙස ද ශිල්පීන් විසින් හඳුන්වයි. ඒ මත මිනිරන් පතුරු තබා මසා ගනිමින් එම මිනිරන් පතුරු මත වර්ණ ගැන්වූ තල පටි මඟින් රටා මසනු ලැබේ.

අධ්‍යයන ප්‍රදේශ ආශ්‍රිත පවුල් සීමිත පිරිසක් පමණක් මෙම කර්මාන්තයේ නියැලෙන අතර සේසත් කර්මාන්තය ආශ්‍රිත වර්තමාන අභියෝගතා ලෙස අමුද්‍රව්‍යය සපයා ගැනීමේ දුෂ්කරතාව ප්‍රධානතම ගැටලුවකි. නව පරම්පරාව වෙනත් රැකියාවල නිරත වීම, අධ්‍යයතනයේදී වැඩිහිටි පිරිසක් පමණක් මෙම කර්මානතයේ නිරත වීමද සාම්ප්‍රදායික ශිල්ප කලාව අගාධයට යාමේ ප්‍රවණතාව තීව්‍ර කරයි. ලක්සල වැනි රාජ්‍ය ආයතන ඔවුන්ගෙන් සේසත් ලබාගත්ත ද ඉන්

වසර ගණනාවක් ගතවුව ද අදාළ මුදල් ලබාගැනීම අපහසුවී ඇත. මේ නිසා පෞද්ගලික වෙළෙන්දන්ට සේසත් යුගලයක් සුළු මුදලකට අලෙවි කිරීමට සිදුව ඇති අතර අතරමැදියන් ඒ හරහා සෘජුව ලාභ ලබයි.

වර්තමානයේ පවතින ආර්ථික අභියෝග හමුවේ කාන්තාවන් පමණක් සේසත් කර්මාන්තයේ නිරතවීම හඳුනාගත හැකි විශේෂ ලක්ෂණයකි. එදා සේසත යනු ස්ථරගත සමාජයෙහි ඉහළ පැළැන්තියේ පරිභෝජන භාණ්ඩයකි. එදා එම භාණ්ඩයෙහි වූ පරිභෝජන අවශ්‍යතාවය අද්‍යයතනයේදී අහෝසි වුව ද, සේසත ඉහළ පැළැන්තිකයින්ගේ විසිතුරු භාණ්ඩයක් ලෙස අලෙවි වෙයි.

සේසත් කලාව උණවේරුවට පමණක් පාරම්පරිකව උරුම වූ කලාවක් වීමත් සාම්ප්‍රදායික ශිල්පීන් මෙම ශිල්පක්‍රම සමාජගත කිරීම කෙරෙහි දක්වන අකමැත්තත් නිසාවෙන් අවි අතු කලාව පරම්පරාවෙන් පරම්පරාවට පමණක් විකාශනය වීමත් තුළින් සේසත් කර්මාන්තය අනාගතයේදී සුවිශේෂී වූ හස්ත කර්මාන්තයේ සොඳුරුතම ලකුණක් ලෙස ශේෂ මාත්‍රයක් පමණක් වනු ඇත .එම නිසාවෙන් මෙම කර්මාන්තය ප්‍රවර්ධනය උදෙසා දේශීය හා විදේශීය වශයෙන් අලෙවිකරණ ප්‍රවර්ධන සැලසුම් සැකසීම කාලීන අවශ්‍යතාවයකි. එහිදී මූලික වශයෙන්ම දේශීය හා විදේශීය සංචාරකයන් ඉලක්ක කර ගනිමින් සේසත නිර්මාණකරණය පිළිබඳ ප්‍රායෝගික වැඩසටහන් පැවැත්වීම මෙන්ම ඒ සඳහා කැමැත්තක් දක්වන ලබන පිරිස් සහභාගී කර ගැනීම තුළින් ඒ හරහා අලෙවිකරණය ද පුළුල් කර හැක. මාතලේ වනාහි මහනුවර, යාපනය ප්‍රධාන මාර්ගය අසල පිහිටා ඇති කේන්ද්‍රස්ථානයක් වන අතර ශ්‍රී දළදා මාලිගාව, දඹුල්ල, සීගිරිය වැනි උරුම ස්ථාන අවට සාම්ප්‍රදායික සේසත් අලෙවිසැල් ස්ථානගත කිරීමට හැකිනම් අලෙවිකරණ මට්ටම ඉහළ නැංවිය හැක. රාජ්‍ය හා රාජ්‍යය නොවන සංවිධානයන්හි සහය ලබා ගනිමින් සේසත විවිධාංගීකරණය ලක් කරමින් එනම් සේසත භාවිතයෙන් වෙනත් නිර්මානකරණයන් (බිත්ති සැරසිලි, සේසත යෙදූ අත්බෑග්) වලට යොමු වීම තුළින් ද අලෙවිකරණය පුළුල් කළ හැක.

## සමාලෝචනය

සේසත් කර්මාන්තය හා බැඳි සාම්ප්‍රදායික දැනුම හා ශිල්ප ක්‍රම වනාහි ලාංකීය කලාවේ සුපෝෂිතතාවය හා පරිසර හිතකාමී බව මොනවට කියාපායි. උණවේරුව වැනි සාම්ප්‍රදායික ලක්ෂණ දරණ ගමක් සතුව පවතින සාම්ප්‍රදායික දැනුම රැස් කරගනිමින් නූතන සමාජ සංවිධානය තුළ අපගේ අනන්‍යතාවය වියැකී යාමට ඉඩ නොදී සාම්ප්‍රදායික සේසත් කර්මාන්තය ප්‍රවර්ධනය උදෙසා සැලසුම් සැකසීම කාලීන අවශ්‍යයතාවයකි.

ආශ්‍රිත මූලාශ්‍රය

***මහාවංසය***, (1860). සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත, කොළඹ: රත්නාකර ප්‍රකාශකයෝ.

***සිංහල බෝධිවංසය.*** (1970). සංස්, ගුණපාල සේනාධීර, ගල්කිස්ස: අභය ප්‍රකාශකයෝ.

කුමාරස්වාමි, ආනන්ද. (2010). ***මධ්‍යකාලීන සිංහල කලා.*** නුගේගොඩ: තිසර ප්‍රකාශකයෝ,

නාගොඩ විතාන, රත්නපාල. (2010). ***ලක්දිව අත්කම් ශිල්ප කලා,*** නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.